www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 11 |
| --- | --- | --- |

## කරදිය, කුඹි කතාව මුද්‍රා නාට්‍ය

- **ප්‍රශ්න අංක 01 සිට 14 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) කරදිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
1) එස්. පණීභාරත මහතා.
2) චිත්‍රසේන ඩයස් මහතා.
3) ප්‍රේමකුමාර එපිටවල මහතා.
4) ජී. රංගනාත් මහතා.

02) කරදිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ කුමන වසරේදී ද?
1) ක්‍රි.ව. 1960 දී ය.
2) ක්‍රි.ව. 1961 දී ය.
3) ක්‍රි.ව. 1962 දී ය.
4) ක්‍රි.ව. 1965 දී ය.

03) කරදිය මුද්‍රා නාට්‍ය සඳහා පසුබිම් වූ කතා පුවත,
1) ධීවර කරමාන්තය හා බැඳී පවතී.
2) කෘෂිකර්මාන්තය හා බැඳී පවතී.
3) බෞද්ධාගමික කතා පුවතකි.
4) ඓතිහාසික කතා පුවතකි.

04) කරදිය මුද්‍රා නාට්‍යයේ ප්‍රධාන චරිත දෙකකි,
1) සීසී සහ මණ්ඩාඩිරාළ
2) සිසී සහ පුෂ්පකර
3) මකුලුවා සහ මැස්සා
4) නල සහ දමයන්ති

05) කරදිය මුද්‍රා නාට්‍යයේ ගීත රචනා කර ඇත්තේ කවුරුන් විසින් ද?
1) ඩබ්ලිව්. ඩී. අමරදේව
2) ලයනල් අල්ගම
3) මහගම සේකර
4) ෂෙල්ටන් ප්‍රේමරත්න

06) කරදිය මුද්‍රා නාට්‍යයෙහි බීමත්ව එන මණ්ඩාඩිරාළගේ ගමන් විලාසය නිර්මාණය කිරීමට ආභාෂය ලබා ඇත්තේ,
1) පහතරට බෙන්තර ශෛලියෙහි සුද්ධ මාත්‍රා පදයයි.
2) පහතරට මාතර ශෛලියෙහි සුද්ධ මාත්‍රා පදයයි.
3) පහතරට රයිගම ශෛලියෙහි මඟුල් රාගය පදයයි.
4) පහතරට දෙවොල් මඩුවේ ගෙජ්ජි මාත්‍රා පදයයි.

07) කරදිය මුද්‍රා නාට්‍යයෙහි එන සිසී සහ ඇගේ පෙම්වතා වන චන්ද ගේ චරිත නිරූපණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
1) වජිරා සහ සේන වලවේ
2) වජිරා සහ රවිබන්දු විද්‍යාපති
3) වජිරා සහ චිත්‍රසේන ඩයස්
4) වජිරා සහ විමල් නයනානන්ද

08) කරදිය මුද්‍රා නාට්‍යයෙහි සංගීතය නිර්මාණය සහ ඊට සහය ලබා දෙන ලද්දේ කවුරුන් විසින් ද?
1) ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ලයනල් එදිරිසිංහ
2) ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ලයනල් රංවල
3) ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ලයනල් ලොකුලියන
4) ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ලයනල් අල්ගම



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

09) කුඹි කතාව ළමා මුද්‍රා නාට්‍ය අධ්‍යක්ෂණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
1) උපේකා චිත්‍රසේන 2) අංජලිකා චිත්‍රසේන
3) වජිරා චිත්‍රසේන 4) චිත්‍රසේන ඩයස්

10) කුඹි කතාව ළමා මුද්‍රා නාට්‍යයේ ප්‍රථම දර්ශනය පවත්වන ලද්දේ කුමන වර්ෂයේ දී ද?
1) ක්‍රි. ව. 2005 2) ක්‍රි. ව. 2006
3) ක්‍රි. ව. 2007 4) ක්‍රි. ව. 2008

11) කුඹි කතාව ළමා මුද්‍රා නාට්‍යයේ මුල් කෘතිය කුමක් ද?
1) වීර කුඹියෝ 2) නිදහස් කුඹියෝ
3) කුඹි කතාව 4) කුඹින රාජ්‍යය

12) කුඹි කතාව ළගා මුද්‍රා නාට්‍යයේ මුල් කෘතිය රචනා කර ඇත්තේ කුමන බසකින් ද?
1) ප්‍රංශ බසිනි. 2) ජපන් බසිනි.
3) ලතින් බසිනි. 4) රුසියානු බසිනි.

13) කුඹි කතාව ළමා මුද්‍රා නාට්‍යයේ මුල් කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් 2) සැමුවෙල් බෙකට්
3) ටටියානා මකරෝවා 4) ඇන්ටන් චෙකොව්

14) කුඹි කතාව ළමා මුද්‍රා නාට්‍යයේ ආලෝක නිර්මාණය සිදු කර ඇත්තේ කවරෙකු විසින් ද?
1) මහින්ද ඩයස් 2) තුෂාර ඩයස්
3) හේෂ්මා විග්නරාජා 4) මහේෂ් උමගිලිය

- **පහත දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

15) කරදිය මුද්‍රා නාට්‍යයේ ප්‍රධාන කාන්තා චරිතය නිරූපණය කරන්නේ ...................................... මහත්මිය විසිනි.

16) කරදිය මුද්‍රා නාට්‍යයට තේමා කොට ගෙන ඇත්තේ ...................................... ප්‍රජාව සම්බන්ධ කතා පුවතකි.

17) කරදිය මුද්‍රා නාට්‍යයේ නර්තන නිර්මාණය කරන ලද්දේ ...................................... සහ ...................................... විසිනි.

18) ''මහ මුහුදේ ඈත ඉඳන් - වෙරළ බලා දවස පුරා
රැළි පිට රැළි පෙරළි පෙරළි ඇදෙනවා'' යන ගීතය ...................................... මුද්‍රා නාට්‍යයේ අන්තර්ගත ගීතයකි.

19) කරදිය මුද්‍රා නාට්‍යයේ මණ්ඩාඩිරාළගේ හා මකුළුවාගේ චරිත නිරූපණය කරන ලද්දේ ...................................... මහතා විසිනි.

20) කරදිය මුද්‍රා නාට්‍යයේ ...................................... මහතා වේදිකා සැරසිලි නිර්මාණ ශිල්පියා වන අතර ...................................... මහතා ආලෝකකරණ නිර්මාණ ශිල්පියා වේ.

21) කරදිය මුද්‍රා නාට්‍යයේ තේමා ගීතය රචනා කර ඇත්තේ ...................................... මහතා විසිනි.

22) කරදිය මුද්‍රා නාට්‍යයේ ඔරු අයිතිකරු හෙවත් ධීවර මුදලාලිව හඳුන්වන්නේ ...................................... යන නමිනි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

23) කරදිය මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා වන්නේ ...................................... මහතාය.

24) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ නිර්මාණය කරන ලද්දේ ...................................... ශිල්පියා විසිනි.

25) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයට අනුව කුඹීන්ගේ නිවහන විනාශ කර දමන්නේ ...................................... විසිනි.

- **පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

26) කරදිය මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත ලියන්න.

27) කරදිය මුද්‍රා නාට්‍යයෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න.

28) කරදිය මුද්‍රා නාට්‍ය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

29) කරදිය මුද්‍රා නාට්‍යයේ දක්නට ලැබෙන ගැටුමට ලක්වන සමාජ පන්ති දෙක නම් කරන්න.

30) කරදිය මුද්‍රා නාට්‍යයේ තේමාව කුමක් ද?

31) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයේ සංගීත නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

32) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත ලියන්න.

33) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයේ සාර්ථකත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

34) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍ය සඳහා යොදාගනු ලැබූ රංග භාණ්ඩ 03 ක් නම් කරන්න.

35) කුඹී කතාව ළමා මුද්‍රා නාට්‍යයේ කුඹී පවුලේ අලුත් නිවහනේ පවත්වන තේ සාදයට පැමිණෙන සතුන් වර්ග 03 ක් නම් කරන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk